# නිවේදනය යි!

**පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වෙත.**

<u>1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත උල්ලංඝනය කරමින් චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් පළිබෝධනාශක නිෂ්පාදනය ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම.</u>

සී/ස. මැක්වුඩ්ස් (පුද්.) සමාගම යටතේ වූ සියළුම පළිබෝධනාශක ආනයනය කිරීමේ, ඇසිරීමේ, ගබඩා කිරීමේ, බෙදාහැරීමේ, අලෙවි කිරීමේ ක්‍රියාකාරකම් වර්ෂ 2016 අගෝස්තු මාසය පටන් නවතා දමා ඇති තත්ත්වයක් තුළ ලියාපදිංචි අංක M530000 යටතේ චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් (57.6%ක් කොපර් හයිඩ්‍රොක්සයිඩ්) අඩංගු නිෂ්පාදනය සඳහා වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ කිසිදු නීත්‍යානුකූල වලංගු භාවයක් නොමැති බව මෙයින් අවධාරණය කරමි. සී/ස. මැක්වුඩ්ස් (පුද්.) සමාගම යටතේ සේවය කරමින් සිට ඉන් ඉවත් වූ පුද්ගල කණ්ඩායම් විසින් නීති විරෝධී අන්දමින් මෙම පළිබෝධනාශක ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සිදුකරමින් පවතින බව මූලික පරීක්ෂණවල දී අනාවරණය කර ගෙන ඇත.

දිවයිනේ සමහර පළිබෝධනාශක අලෙවිසැල් සම්බන්ධ කර ගනිමින් සිදු කරන මෙම නීති විරෝධී අලෙවි ක්‍රියාකාරකම් පිළිබඳව සියළුම පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.


ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2019 ජුලි මස 01 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076


